# පඨමො පාඨො

# නමාමි සත්ථාරමනන්තගොචරං

විසාරදං වාදපථාතිවත්තිනං
තිලොකපජ්ජොතමසය්හසාහිනං,
අසෙසඤෙය්‍යාවරණප්පහායිනං
නමාමි සත්ථාරමනන්තගොචරං.

තිලොකනාථප්පභවං භයාපහං
විසුද්ධවිජ්ජාචරණෙහි සෙවිතං,
පපඤ්චසඤ්ඤොජනබන්ධනච්ඡිදං
නමාමි ධම්මං නිපුණං සුදුද්දසං.

පසාදමත්තෙන'පි යත්ථ පාණිනො
ඵුසන්ති දුක්ඛක්ඛයමච්චුතං පදං,
තමාහුණෙය්‍යං සුසමාහිතින්ද්‍රියං
නමාමි සඞ්ඝං මුනිරාජසාවකං.

**(දාඨාවංසො)**

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **විසාරදං** | (නා) | - | විශාරද වූ |
| **වාදපථාතිවත්තිනං** | (ස) | - | වාද මාර්ගයන් ඉක්මවන්නා වූ |
| **තිලොකපජ්ජොතං** | (ස) | - | තුන්ලොවට පහනක් වූ |
| **අසය්හසාහිනං** | (ස) | - | ඉවසිය නොහැකි දෑ ඉවසන්නා වූ |
| **ඤෙය්‍යාවරණප්පහායිනං** | (ස) | - | ඤෙය්‍ය මණ්ඩලයට බාධක වූ (අවිද්‍යා ආදී) පාපධර්ම ප්‍රහාණය කරන |
| **අනන්තගොචරං** | (ස) | - | කෙළවරක් නැති විෂය පථය ඇති |
| **සත්ථාරං** | (නා) | - | ශාස්තෘන් වහන්සේ |
| **තිලොකනාථප්පභවං** | (ස) | - | තුන්ලොවට පිහිට වූ බුදුන් කෙරෙන් උපන් |
| **භයාපහං** | (ස) | - | භය දුරුකරන |
| **විසුද්ධවිජ්ජාචරණෙහි** | (ස) | - | පාරිශුද්ධ විජ්ජාචරණ ධර්මයන් ඇත්තවුන් විසින් |
| **සෙවිතං** | (කි) | - | සෙවුනා ලද |
| **පපඤ්ච** | (නා) | - | ප්‍රපඤ්ච ධර්ම (තණ්හා, මාන, දිට්ඨි) |
| **සඤ්ඤොජනබන්ධනච්ඡිදං** | (ස) | - | සංයෝජන බැම් සිඳින්නා වූ |
| **නිපුණං** | (කි) | - | සියුම් වූ |
| **සුදුද්දසං** | (ස) | - | දැකීමට අතිශයින් අපහසු වූ |

| | | |
|---|---|---|
| **පසාදමත්තෙන** | (ස) | - පැහැදීම් මාත්‍රයකින් |
| **පාණිනො** | (නා) | - සත්වයෝ |
| **දුක්ඛක්ඛයං** | (ස) | - දුක් දුරු කරන |
| **අච්චුතං පදං** | (නා) | - නිර්වාණපදය |
| **ඵුසන්ති** | (ක්‍රි) | - ස්පර්ශ කරති |
| **ආහුණෙය්‍යං** | (ත) | - දුරබැහැරින් ගෙනත් දීමට සුදුසු වූ |
| **සුසමාහිතින්ද්‍රියං** | (ස) | - මනාව සංසුන් ඉඳුරන් ඇති |
| **මුනිරාජසාවකං** | (ස) | - බුද්ධශ්‍රාවක වූ |

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. පඨමාය ගාථාය දාඨාවංසකත්තා කං නමස්සති ?
ii. දුතියාය ගාථාය කත්තා ධම්මස්ස කති ගුණානි දස්සෙති? තානි උද්ධරිත්වා දස්සෙතු.
iii. ධම්මො කෙහි සෙවිතො හොති ?
iv. පාණිනො කානි ඵුසන්ති ?
v. කෙ සුසමාහිතින්ද්‍රියා ආහුණෙය්‍යා භවන්ති?

2. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. බුදුරදුන් පිළිබඳ මෙහි දක්වා ඇති විශේෂ ගුණ මොනවා ද?
ii. සංයෝජන ධර්ම නම් කරන්න.
iii. ඉන්ද්‍රිය සංවර කළෝ කවරහු ද?
iv. තුන්ලොව නම් කරන්න.
v. තෙවන ගාථාවෙහි එන සඟගුණ කවරේද?

**අක්ෂර මාලාව**

භාෂාවකට අනන්‍ය වූ වර්ණ මාලාවක් ඇත. ව්‍යාකරණ **සම්ප්‍රදායයන් අනුව පාලි වර්ණමාලාවෙහි වෙනස් කම් පවතී.** එබඳු සම්ප්‍රදායයන් තුනකි.

**කච්චායන සම්ප්‍රදාය**
**මොග්ගල්ලාන සම්ප්‍රදාය**
**සද්දනීති සම්ප්‍රදාය** වශයෙනි.

මෙම සම්ප්‍රදායයන්ගෙන් ලංකාවේ වඩාත් ජනප්‍රිය වූයේ කච්චායන හා මොග්ගල්ලාන සම්ප්‍රදායයන් දෙකයි.

කච්චායන නම් තෙරනමකගේ කෘතියකින් ඇරඹෙන කච්චායන සම්ප්‍රදාය අක්ෂර 41ක් දක්වයි. මෙම සම්ප්‍රදායට අයත් වඩාත් ප්‍රකට ව්‍යාකරණ ග්‍රන්ථ තුනක් ඇත. කච්චායන, රූපසිද්ධි හා බාලාවතාරය වශයෙනි.

**කච්චායන සම්ප්‍රදායට අනුව ස්වර 08කි.**

**අ ආ ඉ ඊ උ ඌ එ ඔ** යනුවෙනි.

මොග්ගල්ලාන නම් තෙරනමකගේ කෘතියකින් ඇරඹෙන මොග්ගල්ලාන සම්ප්‍රදාය අක්ෂර 43ක් දක්වයි. ප්‍රකට ව්‍යාකරණ ග්‍රන්ථ වන්නේ මොග්ගල්ලායනය, පදසාධනය හා පයොගසිද්ධියයි.

මොග්ගල්ලාන සම්ප්‍රදායට අනුව ස්වර 10 කි. **අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ** වශයෙනි. එය කච්චායන සම්ප්‍රදායෙන් වෙනස් වන්නේ ඒ සහ ඕ යනුවෙන් දීර්ඝ ස්වර දෙකක් දක්වීම නිසාය.

**පාලි අක්ෂරමාලාව**

බාලාවතාරයට අනුව පාලි භාෂාවට අයත් වන අකුරු සංඛ්‍යාව 41කි. **(අක්ඛරාපාදයො එකචත්තාලීසං)**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | ආ | ඉ | ඊ | උ | ඌ | එ | ඔ |
| ක | ඛ | ග | ඝ | ඞ | | | |
| ච | ඡ | ජ | ඣ | ඤ | | | |
| ට | ඨ | ඩ | ඪ | ණ | | | |
| ත | ථ | ද | ධ | න | | | |
| ප | ඵ | බ | භ | ම | | | |
| ය | ර | ල | ව | ස | හ | ළ | (අ)ං |

**ස්වර 08 (තත්‍රොදන්තා සරා අට්ඨ)**

**අ ආ ඉ ඊ උ ඌ එ ඔ**

හ්‍රස්ව හා දීර්ඝ යනුවෙන් ස්වර කොටස් දෙකකට බෙදේ.

| | | |
|---|---|---|
| ලඝු (හ්‍රස්ව) 03 | අ ඉ උ | **ලහුමත්තා තයො රස්සා** |
| ගුරු (දීර්ඝ) 05 | ආ ඊ ඌ එ ඔ | **අඤ්ඤෙ දීඝා** |

**ව්‍යඤ්ජනාක්ෂර**

ඉතිරි වර්ණ සියල්ල ව්‍යඤ්ජන ය. **(සෙසා බ්‍යඤ්ජනා)** හල් අකුරු හෙවත් ව්‍යඤ්ජන තනි ව ශබ්ද කළ නො හැකි ය. ස්වරයක ආධාරය අවශ්‍ය ය. එබඳු ව්‍යඤ්ජනාක්ෂර 33කි. ක යන්නේ පටන් බින්දුව දක්වා ඇති අක්ෂර එයට අයත් වේ.

**වර්ගාක්ෂර 25**

ව්‍යඤ්ජනාක්ෂරවලින් 25ක් වර්ගාක්ෂරයෝ ය. ඒවා ‘ක’ වර්ගය ආදි ලෙස පහ බැගින් ගෙන මුල ඇති අකුරේ නමින් හැඳින්වේ. එබඳු වර්ග පහකි. එහි අක්ෂර 25 කි. **(වගගා පඤචපඤචසො මනතා)**

| | | | | | |
|---|---|---|---|---|---|
| **ක වගග -** | **ක** | **ඛ** | **ග** | **ඝ** | **ඞ** |
| **ච වගග -** | **ච** | **ඡ** | **ජ** | **ඣ** | **ඤ** |
| **ට වගග -** | **ට** | **ඨ** | **ඩ** | **ඪ** | **ණ** |
| **ත වගග -** | **ත** | **ථ** | **ද** | **ධ** | **න** |
| **ප වගග -** | **ප** | **ඵ** | **බ** | **භ** | **ම** |

| **අල්පප්‍රාණ (සිථිල) සිථිලං නාම වග්ගෙසු පඨමතතියා (රූපසිද්ධිටීකා)** | **මහප්‍රාණ (ධනිත) ධනිතං නාම දුතිය චතුත්ථා (රූපසිද්ධිටීකා)** |
|---|---|
| අඩු උත්සාහයකින් උච්චාරණය කළ හැකි ය.<br>**ක ග, ච ජ, ට ඩ, ත ද, ප බ** | උච්චාරණයේ දී වැඩි උත්සාහයක් දැරිය යුතු ය.<br>**ඛ ඝ, ඡ ඣ, ඨ ඪ, ථ ධ, ඵ භ,** |

**වර්ගාන්තාක්ෂර 05:-**

වර්ගවල අවසානයට ඇති ඞ ඤ ණ න ම අකුරු වර්ගාන්ත නම් වේ. **නාසික්‍ය** යනු ද මේවාට තවත් නමකි.

**ඊෂත්පෘෂ්ට අක්ෂර:-**

උච්චාරණයේ දී මඳක් උත්පත්ති ස්ථානය ස්පර්ශ ව උත්පත්තිය සිදුවන්නේ ඊෂත්පෘෂ්ට නම් වේ. අන්ත්‍යස්ථ නමින් ද මේවා හැඳින්වේ.

**ය ර ල ව යනු යි.**

| | |
|---|---|
| **අඝෝෂාක්ෂර 11**<br>**'වග්ගානං පඨමදුතියා සොචාඝොසා'**<br>(වර්ගාක්ෂරවල පළමු හා දෙවන අකුරුත් 'ස' අකුරත් අඝෝෂ ය.) | **ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ස** |
| **ඝෝෂාක්ෂර 21**<br>**'ළන්තාඤ්ඤෙ ඝොසා '**<br>(ළ අන්තකොට ඇති ඉතිරි අකුරු ඝෝෂ ය.) | **ග ඝ ඞ ජ ඣ ඤ ඩ ඪ ණ ද ධ න**<br>**බ භ ම ය ර ල ව හ ළ** |

**නිග්ගහීතය:-**

නිග්ගහීතය යනු 'ං' ට (බින්දුව) තවත් නමකි. පූර්ව යුගයන්හි මෙය අකුර උඩ ලියා ඇත. එනිසා බින්දුව සිළුමිණක් බඳුයැයි කියනු ලැබේ.

**"බින්දුචූළාමණාකාරො - නිග්ගහීතන්ති වුච්චති**
**කෙවලස්සාප්පයොගත්තා - අකාරොසන්නිධීයතෙ"**

තනි ව ශබ්ද කළ නොහැකි නිසා බින්දුව මුලට 'අ' කාරයක් යොදා උච්චාරණය කරනු ලැබේ. **(අං ඉති නිග්ගහීතං)**

**අකුරු උපදින ස්ථාන:-**

සෑම අකුරක් ම උච්චාරණය වනුයේ යම් ස්ථානයක් හෝ කීපයක් ඇසුරු කරගෙන ය. අකුරු උපදින ස්ථාන මෙසේ ය.

| අකුරු උපදින ස්ථාන | උපදින අකුරු | බාලාවතාර නියමය |
|---|---|---|
| උගුර - කණ්ඨ | අ ආ ක ඛ ග ඝ ඞ හ | අකවග්ගහා කණ්ඨජා |
| තල්ල - තාලු | ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය | ඉචවග්ගයා තාලුජා |
| තල්ලේ මුදුන -මුද්ධ | ට ඨ ඩ ඪ ණ ර ළ | ටවග්ගරළා මුද්ධජා |
| දත් - දන්ත | ත ථ ද ධ න ල ස | තවග්ගලසා දන්තජා |
| තොල් - ඕට්ඨ | උ ඌ ප ඵ බ භ ම | උපවග්ගා ඔට්ඨජා |
| නහය - නාසිකා | ඞ ඤ ණ න ම (අ)ං | |
| උගුර හා තල්ල - කණ්ඨ තාලු | ඒ | එකණ්ඨතාලුජො |
| උගුර හා තොල් - කණ්ඨ ඕට්ඨ | ඕ | ඔකණ්ඨොට්ඨජො |
| දත් හා තොල් - දන්ත ඕට්ඨ | ව | වොදන්තොට්ඨජො |

**විශේෂ**

ඡන්දස් ශාස්ත්‍රයේ දී අක්ෂර භාවිතය වැදගත් වේ. එහි දී අකුරු තුනක් 'ගණ' නමින් හැඳින්වේ. අලංකාර ශාස්ත්‍රයේ දී, විශේෂයෙන් පද්‍ය බන්ධනයේ දී මෙය වැදගත් වේ. එහි දී ලඝු (තනි මාත්‍රාව හෙවත් හ්‍රස්ව) ගුරු (මාත්‍රා දෙකක් හෝ වැඩි ප්‍රමාණයක්) වශයෙන් අකුරු ගණනය කරනු ලැබේ. ස්වර ප්‍රස්ථාර ඇඳීමක් ද මෙහි දී සිදු කෙරේ. එම ස්වර ප්‍රස්ථාර සඳහා යොදාගනු ලබන සංකේත අනුව හ්‍රස්වාක්ෂරය නම් කරනුයේ කෙටි ඉරකිනි. (-) එවන් අකුරු තුනක් ගණයක් ලෙස සැලකේ.

උදා:-

**සරණ** (---) මෙහි ඇත්තේ ලඝු ම අකුරු තුනකි.

ඡන්දස් ලකුණු කිරීමේ දී දීර්ඝාක්ෂරය සඳහා 'ගුරු' යන්න භාවිත කරන අතර එය සලකුණු කරනුයේ වක්‍ර රේඛාවකිනි. (◡)

උදා:-

**ආරාම** (◡◡- )

ඡන්දසේ දී ගුරු අකුරු නියමයන් පහත සඳහන් පරිදි වේ.

- දීර්ඝාක්ෂර ගුරු වේ. **ආචරියා** (◡ - - ◡)
- සංයෝගාක්ෂරයකට පෙර ඇති හ්‍රස්ව අකුර ගුරකි. **වුසන්ති** ( - ◡ -)
- නිග්ගහීතයට පූර්ව අකුර ගුරකි. **අච්චුතං පදං** (◡ -◡ -◡ )
- ගාථාවක පාදාන්තය ගුරකි. **ඉමිනා පුඤ්ඤකම්මෙන** (- - ◡◡ - ◡ ◡ ◡)

**අභ්‍යාස**

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අනුව ස්වර පිළිබඳ වෙනස දක්වන්න.
ii. පහත වචන අකාරාදි පිළිවෙළට ලියන්න.
මාසෙ, රමෙම, ලංකා, සුගතො, උපාගතො, සිරොපරි,
ඨානං, විසොධෙතුං, එකයොජන, ගංගාතීරෙ,
iii. ඝෝෂ හා අඝෝෂ භේදය පැහැදිලි කරන්න.
iv. උප්පත්ති ස්ථාන අනුව වර්ණමාලාව ප්‍රභේදකර දක්වන්න.



නොමිලේ බෙදා හැරීම පිණිසයි

2. පහත ගාථා පාඨ නිවැරදි ව ලියන්න.

i. කායොවිගුච්ජො සකලො සුගන්ධො
ii. එත්තාවතාච අමෙම්හි
iii. එතං කුසුම සනෙතාසිං
iv. ඉච්චිතං පච්චිතං
v. අජ්ජයං කම මෙ හනෙත

3. පහත සූත්‍රවල සිංහල තේරුම ලියන්න.

i. අං ඉති නිග්ගහීතං
ii. ළන්තාඤෙඤ ඝොසා
iii. වග්ගානං පඨමදුතියා සොචාඝොසා
iv. තත්ථොදන්තා සරා අට්ඨ
v. අක්ඛරාපාදයො එකචත්තාලීසං

4. පහත සඳහන් වචනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරන්න.

| | | | |
|---|---|---|---|
| අනනො | ---------- | විරත්ථචිත්තා | ---------- |
| බබ්බුව | ---------- | සත්ථා සදාහන්තු | ---------- |
| සුබිසත්තා | ---------- | සත්තාරො | ---------- |
| සථසහස්ස | ---------- | පුරිසධම්මසාරති | ---------- |
| විඤ්ඤෙඤාහී'ති. | --------- | විබූසයං | ---------- |

i. සිථිල හා ධනිත අකුරු වෙන වෙන ම ලියන්න.
ii. 'ඉච වග්ගයා තාලුජා' යනු කුමන අකුරුදැයි ලියන්න.
iii. බින්දුව පුරාණ පොත්වල ලියා ඇති අයුරු දක්වෙන බාලාවතාර ඉගැන්වීම කුමක් ද?
iv. නාසිකාක්ෂර ලියා ඒවාට එසේ පවසන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න.
v. ලංකාවේ ජනප්‍රිය වූ පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් දක්වා, ඒවාට අදාළ ප්‍රකට ග්‍රන්ථ ලියා දක්වන්න.